# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 2041 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 29/07/2024 පැය 0600

## මාධ්‍ය නිවේදනය

### 01. වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකුට තුවාල සිදු කිරීමක් - හබරාදූව පොලිස් වසම.

2024.07.28 වන දින රාත්‍රී කාලයේ හබරාදූව පොලිස් වසමේ දික්කුඹුර මාර්ගයේ හරුමල්ගොඩ ප්‍රදේශයේදී යතුරුපැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් තවත් පුද්ගලයින් දෙදෙනෙකුට වෙඩි තබා පලාගොස් ඇති බවට හබරාදූව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

අපරාධකරුවන් විසින් පාගමනින් ගමන් කරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකුට වෙඩි තබා ඇත. ඉන් එක් පුද්ගලයෙකු වෙඩි වැදීමෙන් තුවාල ලබා ඇති අතර අනෙක් පුද්ගලයා බේරී පලාගොස් ඇත. අනතුරුව තුවාලකරු මාර්ගයේ ගමන් කරමින් තිබූ ත්‍රීරෝද රථයකට නැඟීමට උත්සාහ කිරීමේදී සැකකරුවන් විසින් ත්‍රීරෝද රථය දෙසට වෙඩි තබා ඇත. එහිදී ත්‍රීරෝද රථයේ රියදුරුටද වෙඩි වැදී ඇති අතර ඔහු නොනවත්වා ධාවනය කර ඇත. තුවාලකරුවන් දෙදෙනාම කරාපිටිය රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුලත් කර ඇත.

**තුවාලකරුවන් අවුරුදු 34 හා 54 වයස්වල පසු වූ හබරාදූව සහ අඟුළුගහ යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර අපරාධය සඳහා සඳහා පිස්තොල වර්ගයේ ගිනි අවියක් භාවිතා කර ඇත. සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා හබරාදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. සැකකටයුතු මරණයක් - දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසම

2024.07.28 වන දින රාත්‍රී කාලයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ මුවපැටිකේවෙල ප්‍රදේශයේ පිටවාන මාර්ගයේ පුද්ගලයෙකු මියගොස් ඇති බවට ලද පණිවිඩයකට අනුව දෙහිඅත්තකණ්ඩිය පොලිසිය විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ මුවපැටිකේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු ටී ෂර්ට් එකක් සහ කොට කලිසමක් හැඳ සිට ඇති අතර උඩුබැලි අතට වැටී සිට ඇති අතර මරණකරුගේ බෙල්ලේ තුවාල ලකුණක් සහ ශරීරයේ හා ඒ අවට ලේ තැවරී ඇත. මරණකරු වැටී සිටින ස්ථානයේ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ඔහු පැමිණි යතුරුපැදියද තිබී හමුවී ඇත.

මෘත ශරීරය කන්තලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - අවිස්සාවේල්ල පොලිස් වසම

2024.07.28 වන දින දහවල් කාලයේ අවිස්සාවේල්ල පොලිස් වසමේ කරදන ප්‍රදේශයේ නච්චිමලේ ඇලේ දිය නාමින් සිටි පිරිසක් අතුරින් පිරිමි ළමුන් දෙදෙනෙකු දියේ ගිලී ඇත. ඉන් එක් ළමයෙකු බේරාගෙන ඇති අතර අනෙක් ළමයා දියේ ගිලී මියගොස් ඇති බවට අවිස්සාවේල්ල පොලිසියට ලද පණිවිඩයකට මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මියගිය ළමයා වයස අවුරුදු 17 ක් වන බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැම්පත් කර ඇති අතර, අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.07.28 වන දින දහවල් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ තෙලවල හන්දියේදී හා කටුකුරුඳුවත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 200 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 28 වයස්වල පසුවන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය.**

2024.07.28 වන දින දහවල් කාලයේ බොරලැස්ගමුව පොලිස් වසමේ බොරුපන පාලම අසලදී බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බොරලැස්ගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොරලැස්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.**

2024.07.28 වන දින සවස් කාලයේ බගවන්තලාව පොලිස් වසමේ පෙට්‍රසෝ වත්තේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු මැණික් ගැරීමට යොදා ගත් උපකරණ සමඟ අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33, 45, 47 හා 60 වයස්වල පසුවන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අඹන්පොල පොලිස් ස්ථානය.**

2024.07.28 වන දින දහවල් කාලයේ අඹන්පොල පොලිස් වසමේ රණෝරුව ප්‍රදේශයේදී අඹන්පොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන අඹන්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඕමන්ත පොලිස් ස්ථානය.**

2024.07.28 වන දින දහවල් කාලයේ ඕමන්ත පොලිස් වසමේ පාලමෝට්ටේ ප්‍රදේශයේදී ඕමන්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු මුදලට විකිණීම හා **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන ඕමන්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී මොහුට වචිනියාව ගරු මහෙස්ත්‍රාත් අධිකරණය මගින් විවෘත වරෙන්තු නිකුත් වී ඇති බවට අනාවරණය වී ඇත. ඔමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. නාඳුනන මෘත ශරීරයක් හමුවීමක් - සීදූව පොලිස් වසම

2024.07.28 වන දින දහවල් කාලයේ සීදූව පොලිස් වසමේ කිදිගොඩ ප්‍රදේශයේ දඩු ගං ඔයේ මියගිය පිරිමි පුද්ගලයෙකුගේ මෘත දේහයක් ඇති බවට සීදූව පොලිසියට ලද පණිවිඩයකට මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරු වී නොමැති අතර වයස අවුරුදු 45 ත් 50 ත් අතර වූ උස අඩි 05 අඟල් 10 ක් පමණ වේ. අවසන් වරට කොළ පාට ටී ෂර්ට් එකක් හා කහ සහ කළු පැහැති බතික් සරමක් ඇද සිට ඇත.**

මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැම්පත් කර ඇත. සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාමක් - උහන පොලිස් වසම.

2024.07.28 වන දින උදෑසන කාලයේ උහන පොලිස් වසමේ ගෝනගල ප්‍රදේශයේ කුඹුරු ඉඩමක ගොයම් කපමින් සිටි මැෂින් යන්ත්‍රයකට යට වී පුද්ගලයෙකු බරපතල තුවාල ලබා ගොනාගොල්ල සෙනරත්පුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට උහන පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 67 ක් වන ගොනාගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගොනාගොල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර උහන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**